# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,466 - 2025 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2025.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 426 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 428 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*..........පැමිණිලිකරු.*

*එදිරිව*

වටරක ලියනගේ සෞම්‍යයදාස,
අංක 200, දිසානායක වත්ත,
උඩගම, ඇඹිලිපිටිය.

*...........විත්තිකරුවන්.*

*නඩු අංකය* : HC/Civil/301/2018/MR
*ඇස්කිසි අංකය* : 97/2022
*ස්වභාවය* : උකස්
*ක්‍රියා පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. 14,463,883.57

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ ඇතුළත් 2022 ක් වූ සැප්තැම්බර් මස 09 දින විත්තිකරුවන් විසින් ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව,

විත්තිකරු විසින් පැමිණිලිකරුට-

(අ) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට එක්කෝටි හතලිස් හතර ලක්ෂ හැටතුන් දහස් අටසිය අසූ තුනයි ශත පනස් හතක (රු. 14,463,883.57) මුදල හා ඒ මත පොළිය ද ගෙවීම පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසටත් ;

(ආ) විත්තිකරු ඉහත එක්කෝටි හතලිස් හතර ලක්ෂ හැට තුන් දහස් අටසිය අසූ තුනයි ශත පනස් හතක (රු. 14,463,883.57) මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 17 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසත් ;

(ඇ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්,

තව ද, විත්තිකරු සමථය පරිදි මේ වනතුරු අප ආයතනය වෙත කිසිදු මුදලක් ගෙවා නොමැති බැවින් පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති සහන ලබා ගැනීම සඳහා ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට ඇති බවය :

01. පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති ආකාරයට පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුට විරුද්ධව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීමට විත්තිකරු එකඟ වූ බවටත් ;

02. කෙසේ වුව ද, විත්තිකරු පහත සඳහන් අයුරින් රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) මුදලක් ගෙවනු ලැබුවහොත් නඩු තීන්දුව ඉටුකළා සේ සැලකීමට පැමිණිලිකරු එකඟ වූ බවටත් ;

03. ඉහත කී සමථය ප්‍රකාරව රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) මුදල, වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවීමට විත්තිකරු එකඟ වූ බවටත් ;

04. කෙසේ වුව ද, එකී සම්පූර්ණ සමථය වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවා අවසන් කිරීමට ද, විත්තිකරු එකඟ වූ බවටත් ;

05. වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් සම්පූර්ණ සමථ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් මෙම සමථය ප්‍රකාරව අද දින සිට යම්කිසි මුදලක් ගෙවා ඇත්නම් එම මුදල අඩු කර නඩුව

තීන්දු කර ඇති සම්පූර්ණ මුදල ලබා ගැනීමට සහ ඇස්කිසි ලබා ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට විත්තිකරු එකඟ වූ බවටත් ;

06. අවුරුද්දක කාලයක් ගත වුව ද, විත්තිකරුට විරුද්ධව කිසිදු නොතිසියක් නොමැතිව ඇස්කිසි ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට විත්තිකරු එකඟ වූ බවටත් ;

07. එසේ ඇස්කිසි ගැනීමට සිදුවුවහොත් ඇස්කිසි ගැනීමේ සියලුම ගාස්තු සහ වියදම් විත්තිකරු විසින් දැරිය යුතු බවට විත්තිකරු එකඟ වූ බවටත් ;

08. විත්තිකරු විසින් ඉහත කී සමථය ප්‍රකාරව ගෙවිය යුතු සම්පූර්ණ මුදලවන රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) මුදල, වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 13 දින හෝ ඊට පෙර ගෙවා අවසන් කළ පසු-

(අ) මෙම නඩුවේ විෂයගත දේපළ සඳහා ලියාපදිංචි කර ඇති ලිස්පෙන්ඩනය අවලංගු කිරීමටත්, මෙම නඩුව පවරා ඇති නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 17 සහ 2016.02.17 දින දරන ණය උකස්කරය අවලංගු කිරීමට සහ අවලංගු කළ ණය උකස්කරය විත්තිකරු වෙත නැවත ලබා දීමටත්, පැමිණිලිකරු එකඟ වූ බවටත් ;

09. මෙකී සමථය ප්‍රකාරව සියලු මුදල් ගෙවා නිමකිරීමෙන් පසුව ඉහත කී නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 7 සහ 2016.02.17 දින දරන ණය උකස්කරයෙහි උපලේඛනයේ දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් කිසිදු හිමිකමක් සහ/හෝ අයිතිවාසිකමක් ඉදිරිපත් නොකරන බවට පැමිණිලිකරු එකඟ වූ බවටත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව එම සමථය පරිදි විත්තිකරු විසින් එකී සමථය කඩකර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 19 දින පෙ. ව. 11.30 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ උඩුගම 214 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇඹිලිපිටිය - උඩුගම ග්‍රාමයේ "ජාසිත් ජාගොඩගේ පංගුව කොටස" නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටම්බගේ විසින් මැන සාදන ලද අංක 1320 සහ 1996.03.26 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 06 කැබැල්ලට මායිම් : උතුරට : ලොට් අංක 09 ද, නැගෙනහිරට : FVP 778 හි ලොට් අංක 575 හි කොටසක් ද, දකුණට : ලොට් අංක 5 ද, බටහිරට : ලොට් 16 (මාර්ග අයිතිය) යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයක (පර්. 20.06) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 49/64 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන්වූ වහාම පහත සඳහන් ගෙවීම ගැනුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ :-

01. සම්පූර්ණ ගැනුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය ;
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය ;
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 18 දින දී ය.

12-54

# විවිධ දැන්වීම්

**පාර්ලිමේන්තුව**

ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ඩී. වී. චානක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී භාරකාරීත්වය සංස්ථාගත කිරීමයි :-

(අ) ශ්‍රී ලංකාවේ සියලු ආර්ථික අංශ සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම, පුළුල්කිරීම හෝ නවීකරණය මගින් ජාතික හා සමාජ සංවර්ධනයට දායක වීම ;

(ආ) ග්‍රාමීය තරුණ හා වැඩිහිටි ප්‍රජාවගේ වෘත්තීය පුහුණුව, තාක්ෂණික අධ්‍යාපනය, නායකත්ව සංවර්ධනය, ජීවන කුසලතා සහ ධාරිතා වර්ධනය ඉලක්ක කරගත් මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම, පැවැත්වීම සහ සහාය දීම ;

(ඇ) කෘෂිකාර්මික, කාර්මික, වාණිජ සහ සෙසු ආර්ථික අංශයන්හි කටයුතුවල නියැලී සිටින හෝ නිරතවීමට අදහස් කරන පුද්ගලයින්ට, කණ්ඩායම්, ආයතන හෝ ව්‍යවසායකයින්ට කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය පහසුකම් සහ වෙනත් ආකාරයේ ආධාර සැපයීම ; සහ

(ඈ) කෘෂිකාර්මික, කාර්මික, වාණිජ සහ සෙසු ව්‍යවසායයන් සඳහා නිසි ලෙස පිළිගත් ණය ආයතන විසින් ලබා දෙන මූල්‍ය ආධාර ප්‍රතිමූල්‍යකරණය ඇතුළුව ණය සහ අත්තිකාරම් ලබා දීම සහ පදනම විසින් තීරණය කරනු ලබන, එවැනි පහසුකම් ආපසු ගෙවීම සඳහා අවම හා උපරිම නියමයන් නියම කිරීම,

යනාදිය වේ.

ඩී. වී. චානක,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

12 - 114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.